ප්‍රවෘත්ති නිවේදනය
PRESS RELEASE
සෞඛ්‍ය අමාත්‍යාංශය | சுகாதார அமைச்சு | Ministry of Health
Telephone Office: 2671181 / Gen: 2694033 / 2669192 / 2675011 / 2675449 / Fax: 2689540

**2020.10.20**

ප්‍රධාන කර්තෘ පුවත්පත්,
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ - රූපවාහිනී / ගුවන්විදුලි
සංස්කාරක වෙබ් පුවත්,

**වත්මන් කොරෝනා තත්ත්වය පිළිබඳ සෞඛ්‍ය ලේකම්වරයා සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා කරුණු දක්වයි.**

කොවිඩ්-19 බ්‍රැන්ඩික්ස් පොකුර ආශ්‍රිතව ආසාදිතයින් ව්‍යාප්තවීම සමගම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ගන්නා ලද පියවරයන් පිළිබඳව කරුණු දක්වන සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මේජර් ජනරාල් වෛද්‍ය සංජීව මුණසිංහ මහතා සහ වැඩබලන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් එස්. ශ්‍රීධරන් මහතා මාධ්‍ය වෙත මෙසේ කරුණු දක්වයි.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මේජර් ජනරාල් වෛද්‍ය සංජීව මුණසිංහ මහතා -

“මිනුවන්ගොඩ ඇගළුම් ශාලාව කේන්ද්‍ර කරගෙන පසුගිය 04 වන දා මතු වූ කොවිඩ් පොකුරෙන් මේ දක්වා ආසාදිතයින් 2222 ක් හඳුනාගෙන තිබෙනවා. මෙයට හේතු වී තිබෙන්නේ ඔවුන් රැකියා කරන ස්ථානත්, ඔවුන් නවාතැන් ගෙන සිටින ස්ථානවල ස්වභාවය සහ මොවුන්ගේ හැසිරීමේ ස්වභාවයි. ඉදිරියේ එන අභියෝග වලට මුහුණ දීමට සෞඛ්‍ය අමාත්‍යාංශය ලෙස අපි පෙර සූදානමකින් මේ වනවිට පසුවෙනවා. දෛනිකව සිදු කරන පී.සී.ආර් පරීක්ෂණ සංඛ්‍යාව ඉහළ නැංවීමට කටයුතු කර තිබෙනවා. එමෙන්ම අමාත්‍යාංශය තුල ක්‍රියාත්විත මෙහෙයුම් මැදිරියක් ස්ථාපිත කර තිබෙනවා. .....”

වැඩබලන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් එස්. ශ්‍රීධරන් මහතාගේ කථාවේ ඇතුළත් දත්ත අනුව

01. මේ වනවිට තහවුරු කළ කොරෝනා රෝගීන් මුළු සංඛ්‍යාව - **5685**
02. සුවපත් වූ කොරෝනා රෝගීන් සංඛ්‍යාව - **3457**
03. අද පස්වරුව වන විට රෝහල්ගත කර ඇති කොරොනා රෝගීන් ලෙස සැක සහිත රෝගීන් සංඛ්‍යාව **-329**
04. පී.සී.ආර් පරීක්ෂණාගාර - **24**
05. මේ වනවිට සිදුකර ඇති පී.සී.ආර් පරීක්ෂණ සංඛ්‍යාව - **398,196** ( තුන්ලක්ෂ අනූඅටදාස් එකසිය අනූහයයි)
06. මේ වනවිට ප්‍රතිකාර මධ්‍යස්ථාන - **21**
07. නිරෝධායන මධ්‍යස්ථානවල පසුවන ප්‍රමාණය - **7295 ක් වේ.**

**විරාජ් අබේසිංහ**
**(මාධ්‍ය ලේකම්)**
**සෞඛ්‍ය අමාත්‍යාංශය**